# නවගමුව සුගතබිම්බාරාම විහාර මන්දිරයේ නිරූපිත දේවතා - යක්ෂ සිතුවම් හඳුනා ගැනීම හා ඒවායේ අවකාශීය සංවිධානය පිළිබඳ අධ්‍යයනයක්

රුවන් දිලින්ත වින්ඩ්සර්[1]

## හැඳින්වීම

ස්පර්ශ උරුම ගණයට අයත් වන ශ්‍රී ලංකාවේ විහාර සිතුවම් සෞන්දර්යාත්මක ප්‍රකාශන ලෙස පමණක් නොව ආගමික විශ්වාස, චාරිත්‍රානුකූල පිළිවෙත් සහ සමාජ-සංස්කෘතික වටිනාකම් සන්නිවේදනය කරන දෘශ්‍ය මාධ්‍යයක් ලෙස ද ක්‍රියා කර ඇති අතර කොළඹ දිස්ත්‍රික්කයේ රනාල නවගමුව පිහිටි සුගතබිම්බාරාම බුද්ධ මන්දිරයේ සිතුවම් එයට නිදසුන් වේ. මෙම විහාර මන්දිරය කටුවාවල සුමනතිස්ස නාහිමියන්ගේ අනුදැනුම මත වර්ෂ 1894 දී නිර්මිතය. මෙහි සිතුවම් ශිල්පීන් ලෙස සාරික්කමුල්ලේ සිතුවම් ශිල්පී පම්පරාවේ සාමාජිකයන් කටයුතු කළ බව කියැවෙන අතර පශ්චාත් මහනුවර යුගයේ ශෛලියට අනුකූලව මෙහි සිතුවම් හා මූර්ති නිමවා ඇත. එකී විහාරයේ දේව හා යක්ෂ සිතුවම් සීමිත විද්වත් අවධානයක් ලබා ඇති බව හෙළි වූ අතර ඇතැම් සිතුවම් හඳුනා ගැනීමේ ගැටලු ද පැවතුනි. ඒ අනුව එකී සිතුවම්වලින් නිරූපිත දේව හා යක්ෂ සංකල්පයන් මොනවාද? එලෙස නිරූපණය කිරීමට හේතු මොනවාද සහ ඒවායේ අවකාශීය සංවිධානය කුමක්ද යන ගැටලුව ඔස්සේ මෙම පර්යේෂණය සිදු කරන ලදි. මෙම විහාර මන්දිරයේ නිරූපිත සිතුවම් නිවැරදිව හඳුනා ගැනීම, ඒවායේ විශේෂ ලක්ෂණ හා අවකාශීය සංවිධාන පිළිබඳ අවධානය යොමු කිරීම මෙම අධ්‍යයනයෙන් බලාපොරොත්තු වේ.

## අරමුණු

මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ සුගතබිම්බාරාම පුරාණ විහාර මන්දිරයේ නිරූපිත දේව - යක්ෂ බිතුසිතුවම් ක්‍රමානුකූලව හඳුනා ගැනීම සහ විහාර මන්දිරයේ වාස්තු විද්‍යාත්මක පිරිසැලසුම තුළ ඒවායේ අවකාශීය සංවිධානය විශ්ලේෂණය කිරීම වේ. වාස්තු විද්‍යාත්මක කලාප වන අන්තරාලය, ගන්ධ කුටිය හා කතරගම දේවාල කුටිය යන ස්ථානයන්හි දෙවිවරුන් ස්ථානගත කිරීමේ දී තෝරාගෙන ඇති ධූරාවලි සැලැස්ම හඳුනා ගැනීම මෙහි අනෙක් අරමුණ වේ. නවගමුව විහාරය සමඟ බැඳුණු පූජනීය මෙන්ම ජනප්‍රිය භක්ති පිළිවෙත් හා සාම්ප්‍රදායික ජනවිශ්වාස සිතුවම් කෙරෙහි බලපා ඇති ආකාරය ගවේෂණය කිරීම ද මෙම පර්යේෂණයේ තවත් අරමුණක් වේ.

## ක්‍රමවේදය

පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යොදා ගන්නා ලදි. මෙහි න්‍යායාත්මක පසුබිම සඳහා රූපභේදීය මූලධර්මය හා අවකාශීය සංවිධාන මූලධර්මය යොදා ගන්නා ලද අතර මෙහිදී ප්‍රාථමික මූලාශ්‍රය ලෙස විහාර

1 පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලය. ruwanwind@gmail.com

මන්දිරයේ නිරූපිත දේව සිතුවම් යොදා ගන්නා ලදි. දත්ත එක් රැස් කිරීම සඳහා ක්ෂේත්‍ර නිරීක්ෂණය සිදු කළ අතර නිරීක්ෂණයෙන් අනතුරුව සිතුවම් ඡායාරූපගත කරන ලදි. එසේම පුස්තකාල අධ්‍යයනය ද මෙහිදී භාවිතා කරන ලද අතර සම්මුඛ සාකච්ඡා ද මෙහි දී යොදාගන්නා ලදි. තවද දේවාල නිලරාජකාරිකරුවන්, බැතිමතුන් සමඟ සම්මුඛ සාකච්ඡා පැවැත්වුණි.

## ප්‍රතිඵල

නවගමු විහාරයේ නිරූපිත දේවතා හා යක්ෂ බිතුසිතුවම් පිළිබඳ දෘශ්‍ය සමීක්ෂණයෙන්, මෙරට ආගමික විශ්වාසයන් සමඟ කලාව අතර ඇති සංකේතාත්මක නිරූපණයක් හෙළි වේ. මෙහිදී දේව සිතුවම් නවයක් (09) සහ යක්ෂ සිතුවම් දෙකක් (02) පර්යේෂණයට යොදා ගත් අතර ඒවා නීරීක්ෂණය සහ හඳුනා ගැනීමෙන් අනතුරුව ශ්‍රී ලාංකේය බෞද්ධ සම්ප්‍රදායන් හා සම්බන්ධ දෙවිවරුන්, හින්දු දෙවිවරුන්, දේශීය දෙවිවරුන් හා ආරක්ෂක යක්ෂයන් ලෙස වර්ගීකරණය කළ හැකි විය. හඳුනාගත් සිතුවම් අතර සතරවරම් දෙවිවරු, විභීෂණ, ශිව, විශ්වකර්ම, ගණ, හා පත්තිනි යන දෙවිවරුන්ගේ සිතුවම් වන අතර සිවවටුක හා අසෝර යන යක්ෂ රූප ද වේ. මෙම සිතුවම් බුද්ධ මන්දිරයේ හා එහිම කොටසක් වන කතරගම දේවාලයේ බිත්ති වල ස්ථානගත කර ඇති අතර එමගින් දෙවිවරු බුද්ධ ශාසනයේ හා නවගමු විහාරයේ ආරක්ෂකයින් ලෙස ඉටු කරන ඔවුන්ගේ භූමිකාව නිරූපිතය.




සැලැස්ම 1: බුද්ධ මන්දිරයේ දළ බිම් සැලැස්ම

බුද්ධ මන්දිරයේ දළ බිම් සැලැස්මේ අංකකරණය අනුව අංක 1 - ගණ දෙවි, අංක 2 - විභීෂණ දෙවි, අංක 3 -විරුළ්හ හෙවත් විරූඪක දෙවි, අංක 4-විරූපාක්ෂ දෙවි, අංක 5-ධතරට්ඨ හෙවත් ධෘතරාෂ්ට්‍ර දෙවි, අංක 6- වෛශ්‍රවණ හෙවත් කුවේර දෙවි, අංක 7- විශ්වකර්ම දිව්‍යපුත්‍ර, අංක 8-ශිව (සදාශිව), අංක 9- විෂ්ණු ආසෝර, අංක 10-ශිවවටුක, අංක 11 පත්තිනි දෙවි යන ආකාරයට එම සිතුවම් පෙළගැස්විය හැකිය.

මෙම සිතුවම් තුළ එම එක් එක් දෙවිවරුන්ට අදාළ සුවිශේෂී ගුණාංග ඇතුළත් කළ ඇති අතර උදාහරණයක් ලෙස සතරවරම් දෙවිවරු කඩු අතැතිවද, විභීෂණ දෙවියන් මුඛයෙන් විහිදුනු දළ (දන්ත) සහිතව නිල් ශරීර වර්ණයෙන් යුතුව ද, ගණ දෙවියන් ගජ මුහුණක් සහිතව අංකුසක් වමතින් ගෙන ද නිරූපණය කර ඇත. විශ්වකර්ම දෙවියන් හා ශිව දෙවියන් මුහුණු පහක් සහිතව නිරූපණය කර තිබීම ද සුවිශේෂී වේ. දේව හා

යක්ෂ සිතුවම් විහාර අවකාශිය සන්දර්භය තුළ ස්ථානගත කිරීමේ දී හින්දු සහ බෞද්ධ දෙවිවරුන්ගේ සහජීවනාත්මක නිරූපණය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කොට ඇත. විශ්වකර්ම සහ ශිව මකර තොරණ මට්ටමේ ආකාශීය තලයක නිරූපණය කර ඇති අතර ගණදෙවි, විභීෂණ සහ සතරවරම් දෙවි රූ බිම් මට්ටමේ සිට සිතුවම් කොට තිබේ. නවගමු විහාරය තුළ මෙම සිතුවම් නිරූපණයට තත්කාලීන සමාජයීය බලපෑම් ද ඇති වූ බව මෙහි දී හඳුනා ගන්නා ලද අතර උදාහරණයක් ලෙස කතරගම දේව ප්‍රතිමාවට පසෙකින් ඇති පත්තිනි දේව සිතුවම සම්බන්ධව ජනප්‍රවාදයක් පැවතීම පෙන්වා දීය හැකිය. ඒ එක් එක් සිතුවම් මෙසේ දැක්විය හැකිය.



විභීෂණ හා ගණ දෙවි
අංක 01 සහ 02 සිතුවම



විරූළ්හ දෙවි හා විරූපාක්ෂ දෙවි
අංක 03 සහ 04 සිතුවම



ධෘතරාෂ්ට්‍ර දෙවි හා වෛශ්‍රවණ දෙවි අංක 05 සහ 06 සිතුවම



විශ්වකර්ම දෙවි අංක 07 සිතුවම



ශිව දෙවි අංක 08 සිතුවම



පත්තිනි දෙවි අංක 11 සිතුවම



විෂ්ණු අසෝර සහ සිවවටුක අංක 09 සහ 10 සිතුවම්

මෙම සිතුවම් පශ්චාත් මහනුවර යුගයේ කලාත්මක සම්මුතීන් පෙන්නුම් කරන අතර රූපකායන් නිර්මාණයේ දී ඒ ඒ දෙවිවරුන්ට අදාළ දේහ වර්ණයන් යොදා ගෙන ඇති අතර බාහිර සැරසිලි සඳහා යුරෝපීය රටාවන් ද එක් කර ඇති ආකාරය නිරීක්ෂණය කළ හැකිය.

**සාකච්ඡාව හා නිගමනය**

සුගතබිම්බරාම විහාර මන්දිරයේ දේව හා යක්ෂ සිතුවම් පිළිබඳ අධ්‍යයනයෙන් පෙන්නුම් කරන්නේ 19 වන සියවසේ ශ්‍රී ලාංකේය බෞද්ධ විහාර මන්දිර තුළ අවකාශීය සංවිධානය කෙරෙහි බෞද්ධ සහ දේව කේන්ද්‍රීය භක්ති පිළිවෙත් ඒකාබද්ධව බලපෑ බවයි. එහිදී බුදුන් කෙරෙහි උත්තරීතරභාවය පවත්වා ගනිමින් දේශීය දේව සම්ප්‍රදායන් ක්‍රමයෙන් බෞද්ධ ආගමික සංස්කෘතියට ඇතුළත් කළ බව හඳුනා ගත හැකි විය.

මෙම සිතුවම් හඳුනා ගැනීම සඳහා මූලාශ්‍රයන්ගේ සදහන් ලක්ෂණ, අභිනයන් සහ සංකේතාත්මක අංග විශ්ලේෂණය කිරීම සිදු කළ අතර වෙනත් ස්ථානයන්හි නිරූපිත දේව හා යක්ෂ සිතුවම් සමඟ ද සංසන්දනය කරනු ලැබීය. උදාහරණයක් ලෙස සිව්වරම් රූ හා විභීෂණ රුව කඩුවෙල සංඛපිට්ඨි හා කැලණිය රාජමහා විහාරවල නිරූපිත සිතුවම්වලට සමානය. සිව්වරම් දෙවිවරුන් පිළිබඳ මහාසමය, ආටානාටිය, මහා ගෝවින්ද යන සූත්‍රවල මෙන්ම සුමංගලවිලාසිනී අට්ඨකථාවේ ද සඳහන් වන අතර ඔවුන් දිශාධිපති දෙවිවරුන් ලෙස ද සැලකේ. නිකාය සංග්‍රහයේ ශ්‍රී ලංකාරක්ෂක දෙවිවරුන් ලෙස උපුල්වන්, සමන්, විභීෂණ හා ස්කන්ධ දෙවිවරුන් දක්වා ඇති අතර මෙම බුද්ධ මන්දිරයේ උපුල්වන්, සමන් හා ස්කන්ධ දේව මූර්ති ඉදි කර තිබේ. නවගමුව ද ඇතුලත් බස්නාහිර ප්‍රදේශාධිපති ලෙස සලකනු ලබන විභීෂණ දෙවියන් සිතුවමට නඟා තිබීමෙන් සිව්වරම් දෙවිවරුන් මෙන්ම ලංකාරක්ෂක දෙවිවරුන් ද මෙහි වැඩ වසන බව බැතිමතාට හැඟී යන ලෙස නිර්මිතය. ගණදෙවියන් හා ශිව දෙවියන් මෙහි නිරූපණය කිරීම යුග ගණනාවක් තිස්සේ සිදු වූ හින්දු-බෞද්ධ සහජීවනයේ ප්‍රතිඵලයක් ලෙස හඳුනාගත හැකිය. මෙහිදී හඳුනා ගත් ශිව සිතුවම සදාශිව සිතුවමක් වන අතර එය ලංකාවේ බිතුසිතුවම් කලාව තුළ දුර්ලභ සිතුවමකි. එහි තෙවෙනි ඇස සහිත කොටස හානියට ලක්ව ඇතත් පංච මුහුණකින් යුතුව අත් දහයකින් යුතුව නිර්මාණය කොට ඇති මෙය නිසැක වශයෙන් හඳුනා ගැනීමට දෑත් වල ඇති ආභරණ හා ආයුධ හේතු වේ. දෑත්වල නිරූපණය කර ඇති ත්‍රිශූලය ද, දමරු බෙරය ද ශිව දෙවියන්ගේ නිත්‍යාභරණ වේ.

ශිව සිතුවම සමඟ මකර තොරණෙහි අනෙක් පස ඇති සිතුවම විශ්වකර්ම දෙවියන්ගේ බව හඳුනා ගැනුණි. එම දෙවියන් සතු සියලු අංග ලක්ෂණවලින් පරිපූර්ණ සිතුවමක් ලෙස මෙය හැඳින්විය හැකි අතර එම රුවෙහි දෑත් දහයෙන් නමයක පන්හිඳ, කඩුව, දෙළුම් ඵලය, පැන්කෙණ්ඩිය, පුන්කලස, පත්තිරු, ලඹය හා බෙදුම් කටුව වේ. ඇතැම් සිතුවම්වල දසවෙනි අතෙහි වන නාගයා වෙනුවට මෙහි අභය මුද්‍රාව දක්වා තිබීම ද විශේෂත්වයකි. දීඝනිකායේ මහා සුදස්සන සූත්‍රය අනුව විශ්වකර්ම දෙවියන් බෞද්ධ දෙවිවරයකු ලෙස පිළිගනු ලැබේ.

දේව සිතුවම්වල ප්‍රමාණයට සාපේක්ෂව විෂ්ණු ආසෝර හා සිවවටුක යක්ෂ සිතුවම් විශාලව සිතුවම් ගත කිරීම සමකාලීන ප්‍රවණතාවක් ලෙස හඳුනා ගත හැකි අතර ඒවා කතරගම දේවාල තුළ ස්ථානගත කිරීමෙන් ඔවුන්ගේ ආරක්ෂිත භූමිකාව පෙන්නුම් කරයි. එහිම නිරූපිත පත්තිනි දෙවියන්ගේ සිතුවම මුල් නිර්මාණ සැලැස්ම තුළ නොතිබුනු සිතුවමක් අතර එය පසුව එක් කෙරුණු සිතුවමක් ලෙස හඳුනා ගත හැකිය. මෙම විහාර මන්දිරය ඉදිරිපිට දී කටුවාවල සුමනතිස්ස නාහිමියන්ට පත්තිනි

මැණියන් සැබැවින් දර්ශනය වීමෙන් අනතුරුව එකී ආශ්චර්යමත් සිදු වීම සිහිපත් වීමට දර්ශනය වූ ආකාරයටම මෙම සිතුවම නිර්මාණය කොට ඇත. මෙලෙස බුදු මැදුර බුද්ධ වන්දනාව පිණිස පමණක් නොව බැතිමතුන්ගේ ලෞකික ගැටලු ආමන්ත්‍රණය කරන අතිරේක පූජනීය අවකාශයක් ලෙස ද ක්‍රියා කරන අන්දම මෙයින් තහවුරු වේ.

මෙම පර්යේෂණය තුළින් නවගමුව පුදබිමේ ආගමික පිළිවෙත් සහ ප්‍රජා අනන්‍යතාව බිතුසිතුවම් නිර්මාණය හා අවකාශීය සංවිධානයවීම පිළිබඳව සාකච්ඡා කෙරෙන අතර බෞද්ධාගමික සමාජය සහ දේව වන්දනාව අතර ඇති කල් පවතින අන්තර් ක්‍රියාවලිය පිළිබඳ විමසා බලන ලදි. එසේම මෙම බිතුසිතුවම් කලාත්මක කලා කෘති ලෙස පමණක් නොව ඓතිහාසික හා ආගමික දැනුමේ වැදගත් මූලාශ්‍රය ලෙස ද සංරක්ෂණය කිරීමේ අවශ්‍යතාව මෙයින් අවධාරණය කරයි. අනාගත පර්යේෂණ මගින් මෙම ප්‍රවේශය සෙසු පශ්චාත් මහනුවර සිතුවම් පිළිබඳ සංසන්දනාත්මක අධ්‍යයනයන් සඳහා දිගුවක් ලෙස භාවිත කළ හැකි බව ද සිහිපත් කෙර්.

**මුඛ්‍ය පද** - නවගමුව විහාරය, රූපභේදය, දේව සංකල්ප, දේව සිතුවම්, ජන විශ්වාස

**ආශ්‍රිත ග්‍රන්ථ**

කුමාරතුංග, ධර්ම ශ්‍රී (බු.ව.2501). (සංස්). *නිකාය සංග්‍රහය විවරණය.* කොළඹ: රත්නාකර මුද්‍රණාලය.

ධර්මදාස, කේ.එන්.ඕ. සහ තුන්දෙනිය, එච්.එම්.එස්. (1994). *සිංහල දේව පුරාණය.* කොළඹ: රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව.

වික්‍රමගමගේ, චන්ද්‍රා. (2015). *ශ්‍රී ලංකාවේ බෞද්ධ ප්‍රතිමා කලාව.* කොළඹ: ඇස්. ගොඩගේ සහ සමාගම.

විජේසූරිය, එස් (1997). *ශ්‍රී ලංකාවේ බෞද්ධ හින්දු සහජීවනය.* කෝට්ටේ: සහභාගීත්ව සංවර්ධන පර්ෂදය.

සේදරමන්, ජේ.ඊ. (1967). *බලියාග විචාරය.* කොළඹ: ඇම්.ඩී.ගුණසේන සහ සමාගම.